## පළාත් පාලන සේවය

පහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

**(අ) ජ්‍යෙෂ්ඨ බෙහෙත් සම්පාදක.**

**වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 3,180—6 × 120 සහ 5 × 180—රු. 4,800. එහි රුපියල් 4,080 වැටුපට පළමු **කාර්යක්ෂමතා කඩයිමක් ඇත.**

**සුදුසුකම්.**—අයදුම්කරුවන්ට ලංකා ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ ස්වදේශීය වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම විධි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් හෝ තිබිය යුතු අතර ඩිප්ලොමා සහතිකය ලැබීමෙන් පසු ඖෂධ සම්පාදකයෙක් වශයෙන් අවුරුදු 5 කට නො අඩු **කාලයක පළපුරුද්ද තිබිය යුතුය.**

**(ආ) සහකාර බෙහෙත් සම්පාදක (සාමාන්‍ය).**

**වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 2,100—8 × 120—3,060.

**සුදුසුකම්.**—අයදුම්කරුවන්ට ලංකා ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයයේ වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම විධි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් හෝ තිබිය යුතුය. ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු විශාල වශයෙන් බෙහෙත් සම්පාදනය කිරීමේ පළපුරුද්දක් ඇති ඉල්ලුම් කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ල දක්වනු ලැබේ.

**(ඇ) සහකාර බෙහෙත් සම්පාදක (රස බෙහෙත්).**

**වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 960—17 × 72—2,184. එහි රුපියල් 1,608 වේ වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් ඇත.

**සුදුසුකම්.**—ඉල්ලුම්කරුවන් රස ඖෂධයන් පිළියෙල කිරීම පිළිබඳව අවුරුදු 10 ට නො අඩු කාලයක පළපුරුද්ද ඇති වෛද්‍යවර යින් විය යුතු අතර, මෙම විෂය සම්බන්ධව පුළුල් ප්‍රායෝගික දැනුමක් තිබිය යුතුය. "රස" බෙහෙත් හා ඒවායේ සම්පාදනය ගැන විශේෂඥයින් හැටියට ලියා පදිංචිවූවන් කෙරෙහි වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

**(ඈ) ඖෂධ ගබඩා භාරකරු.**

**වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 2,100—8 × 120—3,060.

**සුදුසුකම්.**—අයදුම්කරුවන්ට ලංකා ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයයේ ස්වදේශීය වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම විධි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් තිබිය යුතුය. ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු ගබඩා භාරකාරත්වය පිළිබඳ පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

2. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් කර සිටින තනතුර සම්බන්ධයෙන් තමා කෙරෙහි ඇති පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර වල පිටපත්, ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන් පළමු කොටම, කොළඹ නාගරික සභාවේ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවට පත්කරනු ලැබේ. ඔවුන්ට පෞද්ගලික වෛද්‍ය කර්මයෙහි යෙදීමට අවසර නැත.

4. මේ ගැසට් පත්‍රයේ (හතර වැනි කොටසේ) ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි, සාරානුකූලව පිළියෙල කොට, 1960 ජූනි මස 18 වැනි දිනට හෝ ඊට ප්‍රථමමා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

6. ඉල්ලුම් පත්‍ර හෝ ඊට අදාල වෙනත් ලියකියවිලි පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමාට හැර, එම දෙපාතීමේන්තුවේ කිසිදු නිලධාරියකුගේ පෞද්ගලික නමට එවිය යුතු නොවේ.

7. රජයේ සේවයේ හෝ පළාත් පාලන බලමණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් නියමිත දිනට පසු ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත හෝ පළාත් පාලන බලමණ්ඩලවල කොමසාරිස්තුමා හෝ සභාපතිතුමා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම ලැබ, පමාවීමට හේතුන් සැළකිය යුතු කරුණු සහිතව දක්වමින්, ඒවා පිළිගත යුතු යයි එම අය විසින් නිර්දේශ කරනු ලබන්නේ නම් එම ඉල්ලුම් පත්‍ර පිළිගැනෙනු ඇත.

8. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7 ක් ඇතුළත ස්වකීය ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දන්වා එවනු නොලැබුවබුහොත් ඒ බව වහාම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දන්වා එවිය යුතුය. මේ විධිවිධානයන්ට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් තම ඉල්ලුම් පත්‍ර සලකා බැලීම සඳහා කිසියම් හිමිකමක් වෙයිනම් එය නැතුව යන්නේය.

වී. සී. ජයසූරිය,
පළාත් පාළන සේවා කොමිෂන් සභාවේ
වැඩ බලන සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
1960 මැයි මස 27 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

---

## පළාත් පාලන සේවය

**පළමුවැනි ශ්‍රේණියේ කම්කරුවන්ගේ තනතුරු 2ක්—යාපනය නගර සභාව හා පොයින්ට් පේද්‍රුරු සුළු නගර සභාව (සී)**

පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින්, පළාත් පාලන සේවයේ, පළාත් පාලන ආයතනයන්හි අවුරුදු 10ක සැළකිය යුතු සේවයක් සම්පූර්ණ කර ඇති දෙවැනි ශ්‍රේණියේ කම්බිකරුවන්ගෙන්, ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 876—14 × 42—1,464 හා රුපියල් 1,212 වීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමද වේ.

3. තෝරාගත් අයදුම්කරුවන් පළමුවෙන්ම යාපනය නගර සභාවට හා පොයින්ට් පේද්‍රුරු සුළු නගර සභාවටද පත්කරනු ලැබේ. ඔව්හු තමන් පත්කරනු ලැබූ පළාත් පාලන ආයතනයෙහි නගර සීමාව තුළ පදිංචි විය යුතුය.

4. මේ ගැසට් පත්‍රයෙහි මුලින් පලකර ඇති පළාත් පාලන සේවයේ තනතුරු සඳහා අදාළ වන කොන්දේසි, අයදුම්කරුවන් විසින් කියවා තේරුම් ගත යුතුයි.

5. තනතුරු සඳහා අදාළ වන සාමාන්‍ය කොන්දේසිවලට අමුනා ඇති ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්, පළාත් පාලන ආයතනයන්හි සභාපතිවරුන්ගේ හෝ නගර සභා කොමසාරිස්වරුන්ගේ මාර්ගයෙන්, 1960 ජූනි 17 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුයි.

6. ඉල්ලුම් පත්‍ර හෝ ඒ සම්බන්ධ වෙන ලිපි ලේඛන ආදිය, මෙමෙ දෙපාතර්මේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපියනට නොව, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත එවිය යුතුයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ වැඩ බලන සභාපති.

1960 මැයි 27 වැනිදා,
තැ. පෙ. 530,
කොළඹ.

